සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
மூன்றாந் தவணை பரீட்சை - 2021
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 9 | විෂයය / பாடம் / Subject | සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper | I | පැය / மணித்தியாலம் / Hours | 02 |
|---|---|---|---|---|---|---|---|

සැලකිය යුතුයි.

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 01 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරන්න.

(01) පොඩි දුවගේ ක්‍රියාකලාපය නිසා තම පවුලේ <u>සායම ගිය බව</u> නැන්දා කීවාය.

1. පවුලට ධන හානියක් සිදු වූ බව
2. ඇඳුම් වල සායම ගිය බව
3. පවුල ලැජ්ජාවට පත් වූ බව
4. පවුලේ සතුට නැති වූ බව

(02) සියදෝරිස් පිළිබඳව ගම්මුන් පැවසුවේ<u>හණමිටිකාරයෙකු</u> ලෙසිනි.

1. දරුණු අදහස් ඇති පුද්ගලයකු
2. හණමිටි විකුණන්නෙකු
3. කරදරකාරයෙකු
4. යල් පැනපු අදහස් ඇති අයකු

- අංක 03 සිට 05 දක්වා ප්‍රශ්න වලට හිස්තැනට සුදුසු පදය තෝරන්න.

(03) හොඳ ගතිගුණවලින් පිරිපුන් ළමයකු සතු විය යුතු ගුණාංග ළමා මනසට ගැළපෙන අයුරින් ............... මහින්ද හිමි කටයුතු කළේය.

1. ප්‍රතිපෝෂණයට
2. ප්‍රතිරෝපණයට
3. ප්‍රතිනිර්මාණයට
4. ප්‍රතිශෝධනයට

(04) විවාද කණ්ඩායමේ නායකයා තම කරුණු ............... ඔප්පු කළේය.

1. තර්කානුකූලව 2. නීත්‍යානුකූලව 3. ධර්මානුකූලව 4. ආගමානුකූලව

(05) දරුවන්ට නිරවුල් මනසකින් යුතුව කටයුතු කිරීමට ................. ලබා දීම තම වැඩිහිටියන්ගේ යුතුකමකි.

1. නිපුණත්වයක් 2. උද්දීපනයක් 3. ඉඩකඩක් 4. අතික්‍රමණය

- අකාරාදී පිළිවෙළට නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.

(06) 1. තලාතුඔය, තුල්හිරිය , තලවකැලේ , තන්තිරිමලේ
2. මහසේන , වට්ටගාමිණී , පැරකුම්බා , ගජබා
3. අවධානය , ආචාර්ය , උද්ධෘත , ජනප්‍රවාද
4. යසෝදරාවත , වෙස්සන්තර , කුසදා කව , දහම්සොඬදා කව

- සෑම පදයක ම මහප්‍රාණ අක්ෂරයක් යෙදී ඇති වරණය තෝරන්න.

(07) 1. උපාධිය , නිශ්ඵල , සජ්ඣායනා , ශාලාව
2. කණ්ඨජ , ඕෂ්ඨජ , ආරූඪ , තද්ධිත
3. අපේක්ෂාව , භෞතික , ශ්‍රේෂ්ඨ , ග්‍රන්ථ
4. පරිශීලනය , පීඨය , අඝෝෂ , ඡන්දය

- සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.

(08) 1. විසේස , අවදානය , අළුත් , ප්‍රතිපල
2. ගුණදර්ම , කනිෂ්ට , ලේඛණ , සම්භාවණීය
3. දර්ශන , විමර්ශණ , සර්ෂණ , තීක්ෂණ
4 නිර්වාණය , ප්‍රවීණ , පරිගණකය , මර්දනය

- මුලින් දී ඇති පදයෙහි සමානාර්ථය නොදෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(09) 1. තඹර - නෙළුම් , පද්ම , අරවින්ද , කුමුදු
2. සතුට - සොම්නස , සතොස , සන්තුෂ්ටිය , තුට
3. ජලය - පැන් , උදක , අඹ , දිය , වතුර
4. රන් - ස්වර්ණ , කනක , කාංචන , කසුන්

- පළමු අක්ෂරයේ රකාරාංශය , යංශය , ඉස්පිල්ල , ගයනුකිත්ත පිළිවෙලින් යෙදී ඇති වරණය තෝරන්න.

(10) 1. න්‍යාය , මෘදුකාංගය , වීදිය , මුහුද
2. විවෘත , අලියා , නිවැරදි , අභූත
3. ප්‍රකාශන , න්‍යායාත්මක , විශ්වය , ඖෂධ
4. විකාශය , මූලාසනාරූඪ , ත්‍යාග , රාශිය

(11) ධීවර භාෂාවේ මුහුදේ රළ හැඳින්වෙන්නේ,

1. ජාලියෝ නමිනි
2. අම්බාවන් නමිනි
3. ඉයත්තුව නමිනි
4 මාරියාව නමිනි

(12) "පියාසර කර ආමි - දේශයෙන් දේශයට
මගේ රට මට අගෙයි - තව්තිසාවට වැඩිය" යන ගීතය රචනා කරන ලද්දේ,

1. කැලිස්ටස් ජයසිංහ මහතා
2. ආනන්ද රාජකරුණා මහතා
3 සුනිල් සරත් පෙරේරා මහතා
4. අරිසෙන් අහුබුදු මහතා

(13) යමක් ඇති සැටියෙන් දැක්වීම,

1. අතිශයෝක්තියයි
2. පුනරුක්තියයි
3. පුනරුදයයි
4. ස්වභාවෝක්තියයි

(14) ප්‍රයෝජ්‍ය ක්‍රියා , විධික්‍රියා ,ආශිර්වාද ක්‍රියා හා මිශ්‍ර ක්‍රියා යන පද වර්ග පිළිවෙළින් යෙදී ඇති පද පේළිය තෝරන්න.

1. නටවයි , බලව , සැදේවා! , දුවමින්
2. නටද්දි , බල බලා , බැලුවොත් , කියා
3. නටා , විමසමින් ,දුවවයි , එද්දී
4. බැලුවොත් , සිතන්න , දිනේවා! , නටමින්

(15) කුමාරතුංග මුනිදාස මහතා ළමයින් සඳහා ලියූ පොතකි.

1. මඩොල් දූව
2. ගම්පෙරළිය
3. මහදැනමුත්තා
4. හීන් සැරය

- පහත 16 සහ 17 වාක්‍යවල හිස්තැනට සුදුසු පිළිතුර තෝරන්න.

(16) ................. පැමිණිය හොත් අපි රැස්වීම පවත්වමු.

1. මිනිසුන් 2. මිනිස්සු 3. මිනිසෙක් 4. මිනිසා

(17) නදී තොමෝ සෙමෙන් සෙමෙන් ගලා .................

1. බසිති. 2. බසින්නේය. 3. බසින්නීය. 4. බැස්සෝය

(18) මුලින් දී ඇති පදයට උදාහරණයක් නොවන පදය සහිත පිළිතුර තෝරන්න.

1. උපමා - නිල් අහසේ දිලෙන තාරුකා වගේ
2. රූපක - නිල් ඉඳුවර - නිලේ අරුම
3. තනි පද - කාලයට උචිත - කාලෝචිත
4. විශේෂණ පද - ළමයා

(19) රචනාවක් ලිවීමේදී සැලකිලිමත් නොවිය යුතු කරුණක් වන්නේ,

1. තේමාවට අදාළ ව කරුණු ඉදිරිපත් කිරීමය
2. කරුණු සංවිධානය ගැනය.
3. නිර්මාණාත්මක භාවය හා ස්වීයත්වය පිළිබඳව ය.
4. එකම දේ නැවත නැවත ලිවීම ය.

(20) පහත දී ඇති A , B , C , D යන වාක්‍ය අතුරින් නිත්‍ය බහු වචන පද යෙදී ඇති වාක්‍ය යුගලය වන්නේ,

(A) අයෙක් නැටීමට දක්ෂ වූහ.
(B) තරුණයෙක් පාරේ ගියහ.
(C) කෙනෙක් උනන්දුවෙන් ඉගෙන ගනිති.
(D) මැණියෝ දරුවන් පෝෂණය කරති.

1. A හා B , C ය.
2. A හා C ය.
3. B හා D ය.
4. D හා C ය.

(ලකුණු 02 x 20 = 40 යි.)

## II කොටස

- මෙම කොටසේ 01 සහ 02 ප්‍රශ්න අනිවාර්ය වේ.
- 03,04,05,06,07 ප්‍රශ්න වලින් තවත් ප්‍රශ්න 03ක් තෝරාගෙන ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

(01) වෘත්තීය බැඳුණු භාෂා ව්‍යවහාර ඇසුරින් ධීවර ජන වහර පිළිබඳව ඔබ උගත් පාඩම මුල්කරගෙන කළ කණ්ඩායම් ක්‍රියාකාරකම ප්‍රයෝජනයට ගෙන මෙම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. ඔබ කණ්ඩායම සැකසූ සඟරාවට යෙදූ නම කුමක් ද ? (ලකුණු 02)
2. එය සැකසීම සඳහා තොරතුරු සපයා ගත් මූලාශ්‍ර 02ක් ලියන්න. (ලකුණු 02)
3. ගුරුතුමිය / ගුරුතුමා ඔබට ලබාදුන් උපදේශයන් 02ක් ලියන්න. (ලකුණු 02)
4. එම නිර්මාණය කිරිමේ දී ඔබ මුහුණ දුන් ගැටලු 02ක් ලියන්න. (ලකුණු 04)
5. එම නිර්මාණය සැකසීමේදී ඔබට ලැබුණු ප්‍රයෝජන 02ක් ලියන්න. (ලකුණු 02)
6. එය නිර්මාණශීලීව ඉදිරිපත් කිරීම සඳහා යොදාගත් උපක්‍රම 02ක් ලියන්න. (ලකුණු 04)

(02) පහත සඳහන් මාතෘකා වලින් එකක් තෝරා ගෙන වචන 200ට නොඅඩු වන සේ වාක්‍ය රචනාවක් ලියන්න.

(අ) වසංගත රෝග ව්‍යාප්තිය පිළිබඳ අද වන විට ලෝකයේ දැඩි අවධානයට ලක් වී ඇත. අපගේ මුතුන්මිත්තන් වසංගත රෝග වලට මුහුණ දීමේදී රෝග ව්‍යාප්තිය වැළැක්වීමට සුදුසු නිරෝධායන ක්‍රමවේද මෙන්ම ප්‍රතිශක්තිය වර්ධනය සඳහාද හෙළ ඔසු භාවිත කරමින් අනුගමනය කළ පිළිවෙත් විස්මිත ය.සම්ප්‍රදායික ක්‍රම පිළිබඳව නූතන පරපුර දක්වන්නේ ඉතා අඩු අවධානයකි.වසංගත රෝග පිළිබඳ සාම්ප්‍රදායික ඥානය අනාගත පරපුර වෙනුවෙන් සුරැකීම අප සතු යුතුකමකි. මෙම කරුණු ඇසුරින්, "හෙළ ඔසු භාවිතයෙන් වසංගත රෝග දුරලමු" මාතෘකාවෙන් රචනයක් ලියන්න.

(ආ) මේ මුළු මිහිතලයේම ජීවත් වන මිනිසා ඇතුළු සියලු ජීවීන්ට ජලය නොමැතිව ජීවත්විය නොහැකි ය.සාගර , මුහුදු , විල් , ගංගා , වැව් ආදී ජල මූලාශ්‍රවල ඇති ජල ප්‍රමාණය ඉතා විශාල වුවත් මිනිසාගේ භාවිතය සඳහා ගත හැකි ජල ප්‍රමාණය ඉතා අල්පය.වර්තමානය වන විට විවිධ මිනිස් ක්‍රියාකාරකම් නිසා ජල සම්පත විනාශ වෙමින් පවතී.මේ සඳහා ඉතා ඉක්මනින් පියවර නොගතහොත් මිනිසා ඇතුලු සියලු ජීවීන් නොසිතූ ලෙස උපද්‍රවයකට පත්වීම වැළැක්විය නොහැකිය.මෙම කරුණු ඇසුරින් "ජල සම්පත සුරකිමු" යන මාතෘකාවෙන් රචනාවක් ලියන්න.

(ඇ) ඈත අතීතයේ ප්‍රාග් ඓතිහාසික යුගවල ජීවත් වූ මිනිසා ගස් , ගල් , ඉර , හඳ , වැස්ස දේවත්වයෙන් පිදූ වස්තූන්ය.ස්වභාව ධර්මයට එසේ කිරීමෙන් එහි ආශිර්වාදය නිරන්තරයෙන් හිමිවන බව ඔවුහු දැන සිටියාහ.හරිත වර්ණය මිනිසාගේ ඇසට මෙන්ම ජීවිතයට ප්‍රියවන්නා සේම ජීවිතය ජීවත් කිරීමට ද අපරිමිත මෙහෙයක් ඉටු කරයි. එමනිසා තුරු ලතා රෝපණය කිරීමට මෙන් ම

එය රැක ගැනීමට ද අප නිරතුරුවම කටයුතු කළ යුතුය."රැකගනිමු තුරු ලතා - අප පණ මෙන්" යන මාතෘකාවෙන් ඉහත කරුණු ඇසුරු කරගෙන රචනාවක් ලියන්න.

(ඈ) එදා සෙනසුරාදා දිනයකි. මගේ කාමරය අසල අඹ ගසෙන් දෙමලිච්චන්ගේ තොරතෝංචියක් නොමැති කෑගැසීම නිසා උදෑසන මම නින්දෙන් අවදි වූ විගසම ඒ දෙසට දිව ගියෙමි.මම අඹ ගස අසලට යන විට දුටු දෙයින් විස්මයට පත්වීමි.............. එතැන් සිට කතාව ගොඩ නගන්න.

(ලකුණු 14 )

(03) පෙළපොතේ ඇතුළත් පාඩම් ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. කරුණා මහිම කොතරම් ද කීවොත් ඔබේ
මැවුණා මහා මහා ගංගාවල් ලෙසින් ඉබේ
ඉනුණා බසින දියරක් තැවරුණොත් මොබේ
මරණාසන්න හුස්මට මුත් ආසි ලැබේ

(අ) ඉහත කවිය රචනා කළ රචකයා නම් කරන්න.
(ආ) එම රචකයා රචනා කළ ළමා පද්‍යා සංග්‍රහයක් නම් කරන්න.

2. "ස්වාමීනි, සිටු පුත්‍රයාණන් වහන්ස, බොහෝ කලක් ජීවත් වුණ මැනව"

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් ග්‍රන්ථය කුමක් ද ?
(ආ) මෙම ග්‍රන්ථය අයත් වන්නේ කුමන යුගයට ද ?

3. "නිල් ඉඳුවර නිලේ අරුම ඇත දියඹ නිලේ වරුණ"

(අ) මෙම පද්‍යා ඇතුළත් කාව්‍ය සංග්‍රහය කුමක් ද ?
(ආ) කාව්‍ය සංග්‍රහයේ කතුවරයා කවු ද ?

4. "නාඩ්දිරිය ලාල මිරයො
අරාබි වායාකා අරාබියා බොලොරේ"

(අ) මෙම සම්ප්‍රදායක ගීත ගායනා කරන්නේ කුමන ජන කොට්ඨාසය ද ?
(ආ) ඔවුන් බහුල ලෙස වර්තමානයේ ජීවත් වන්නේ ශ්‍රී ලංකාවේ කුමන ප්‍රදේශයේ ද?

5. "ඒ පමණ කාලයක් නිවට නියාලු පරසිරිත් අනුකරණය කිරීමෙන් ද තමන් දිනාගත් ජීවන කලාව සම්බන්ධයෙන් වර්තමාන උගත් සිංහලයාට ආඩම්බර වීමට කිසිඳු හේතුවක් නැත."

(අ) මෙය ඇතුළත් වන්නේ කුමන කෘතියක ද?
(ආ) එම කෘතිය ලියන ලද්දේ කවුරුන් විසින් ද?

(ලකුණු 2 x 5 = 10)

(04) පහත සඳහන් පද්‍ය පන්තිය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ඇසෙන්නේ කා - කා හඬ හැම පැත්තෙන්
නැගෙව් කියන්නා වැනි දැන්ම නින්දෙන්
දොරින් අඩක් මේ ඇරියාම එන්නේ
සිසිල් සුළඟ ආයුබෝවන් කියා මෙන්

පියා හඹත් කූඩුවලින් කුරුල්ලෝ
ඉතාම මිහිරියි හඬ දැනෙයි ඔවුන්ගේ
සුළං වැදීමෙන් උදයේ සිසිල් වූ
අලුත් පණක් ගස්වලටත් ලැබිලා

දිසා වෙනැයි මේ හිරු එන්නේ පායා
හැරී සිටි සූරියකත් ගසේ මල්
රැසුයි දිලෙන්නේ ලනු මෙන් ඇදිලා
මඟුල් ගෙයක් දෝ ලොව මේ වෙලාවේ.....

1. කවියේ සඳහන් වන්නේ දවසේ කුමන වෙලාවක් ගැන ද ?
2. කපුටා කැගසන්නේ කුමන අරමුණකින් ද?
3. ගස්වලට නව පණක් ලැබුණේ කෙසේ ද?
4. සූරියකාන්ත මල් දෙන පණිවිඩය කුමක් ද?
5. මෙහි සඳහන් උපමා 2 ක් ලියන්න.

(ලකුණු 2 x 5 = 10)

(05) පහත සඳහන් ඡේදය වචන 20 - 25 අතර සංඛ්‍යාවකින් සාරාංශ කර ලියන්න.

රටක යම් සාහිත්‍යයක් දියුණු වන්නේ නිදහසේ සිතන්නට පුරුදු වුණු කරදර වලින් තොර, බුද්ධිමත් සමාජයක් ඇති වූ විට ය.රට යුද්ධ කෝලහාල වලින් හා දුර්භික්ෂ වලින් පීඩා විඳිමින් මහජනයා හිරිහැරයට භාජනය වී ඇති විට දී උසස් සාහිත්‍යයක් බිහි නොවේ.රට ආහාර අතින් ස්වයංපෝෂිත වීම ද සමාදානයෙන් හා සමගියෙන් යුක්තව ජීවත් වීමට රටවැසියන්ට අවස්ථාව ලැබීම ද, ජනතාව තුළ නව සිතුම් පැතුම් වර්ධනයට හේතු වෙයි.බුද්ධිමතුන් සාහිත්‍යකරණයට පිවිසෙනුයේ එවිට ය.

(06) සඳසිරිගම විද්‍යාලයීය "ප්‍රතිභා ප්‍රභා" වාර්ෂික විවිධ ප්‍රසංගය විදුහල්පතිතුමා හා ගුරු මණ්ඩලයේ ප්‍රධානත්වයෙන් විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී පැවැත්වීමට තීරණය කර ඇත.

දිනය : 2021.10.26
ආරම්භය : පෙ:ව: 9.00ට
ප්‍රධාන ආරාධිත අමුත්තන් : කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා

මෙම අවස්ථාවට සහභාගී වන ලෙස දෙමාපියන්ට යැවීමට සුදුසු ආරාධනා පත්‍රයක් සකස් කරන්න.

(07) පහත සඳහන් පාඨයන්හි අවස්ථා සම්බන්ධය ලියන්න.පාඩම , කවුරුන් විසින් කා හට කියන ලද්දක් ද යන්න ලියා දක්වන්න.

1. "මැණියනි අප මේ පැමිණියේ සමන්ත කූට පර්වතය අසල පිහිටි රත්නපුර නගරයට ය.ගමනේ දුෂ්කර කොටස ඇත්තේ ඉදිරියට ය."

2. "තරහ ගන්න එපා සර්! අපි මේ කරන්නෙත් අසරණ දරුවන්ගේ ඉගෙනීමට උදව් දීමක් තමා"

3. "මහත්තයා කිව්වා තරගෙට යන්නේ දිනන්නට නොවෙයි කියලා.මේ ඉස්කෝලෙත් ඒ තරගෙට ඉදිරිපත් කරන්න ලැබුණු එකත් ලොකු දිනුමක් ලු..."

4. "ඉදින් මූ තුමූ පළමු වයස දී වස්තුව නොනසා කෘෂි වණික් ආදී කටයුත්තක යෙදු නම් මෙම නුවර නායක සිටු තනතුරු ලැබෙති...."

5. "තා බොරු කිව්වොත් තට කවදාවත් නිදහස ලැබෙන්නේ නෑ.තගේ කට පුළුස්සනවා රත් කරපු යකඩෙකින්"

(ලකුණු 2 x 5 = 10)


PAST PAPERS WIKI